අනුරාධපුර තලාව ප්‍රදේශයේ බාලවයස්කාර දැරියක ලිංගික අපයෝජනයට ලක් කිරීමේ පුවතක්, ලංකාදීප පුවත්පතේ (ජන. 28, 2023) වාර්තා වී තිබුණේ මේ අයුරිනි.
සිරස්තලය: "දැරියක සෙල්ලම් බඩුවක් කරගෙන සිටි මාමයි බාප්පයි අත්අඩංගුවට"
පුවත් අන්තර්ගතය: අනුරාධපුර තලාව ප්‍රදේශයේ බාලවයස්කාර දැරියක ලිංගික අපයෝජනයට ලක් කළ බවට පැවසෙන සිදුවීමකට සැක පිට දැරියගේ ඥාති යැයි පැවසෙන දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.
1) බාලවයස් දැරියකට සිදුවූ ලිංගික අපයෝජනයක්, "සෙල්ලම් බඩුවක් කර ගැනීමක්" ලෙසින් දැක්වීම කෙතරම් යෝග්‍ය ද? ඒ ඔස්සේ, ලිංගික අපයෝජනයක බරපතල භාවය එලෙසින්ම සන්නිවේදනය වේ යැයි ඔබ සිතන්නේ ද?
2) මෙවැනි සිරස්තල ඔස්සේ බාලවයස් ලිංගික අපයෝජනයන් සැහැල්ලු කොට දැක්වීම, එවැනි අපරාධ සාමාන්‍යකරණය වීමට ද හේතුවන් නොවිය හැකිද? එය වඩාත් විශාල සමාජ ගැටළුවකට පාර කපන්නක් නොවේ ද?
මෙම මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම Priyadharshini Sivarajah විසින් අපට යොමු කරන ලද්දකි.
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
***අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

